**2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය 237**

පිටු අංකය


01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

1.1. හැඳින්වීම 3
1.2. ආතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3. ප්‍රධාන කාර්යයන් 4
1.4. සංවිධාන සටහන 5
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල් 6
1.7. විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

2.1 සාර්ව ආර්ථික සංවර්ධනය 7
2.2 කෘෂිකර්ම, වාරිමාර්ග , පශු සම්පත්, වැවිලි කර්මාන්ත හා ධීවර 7
2.3 කර්මාන්ත හා වෙළඳ, විදුලි බල හා බලශක්ති 11
2.4 මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන 14
2.5 නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර 14
2.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික 18
2.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ 19
2.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ 22
2.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන 24

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 25
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 25
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 27
3.3 මුදල් ප්‍රවාහක පිළිබඳ ප්‍රකාශය 28
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 30
3.5 අදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 30
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 30
3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙමදෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 31

3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය 31
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 31

04 පරිච්ඡේදය -කාර්ය සාධන දර්ශක 32
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 32

05 පරිච්ඡේදය - තිරිසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 32
5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 32
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 32

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 32
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 32
6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න. 33
6.3 මානව සම්පත් සංවර්ධනය 33

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 34

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනියුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

### මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම


### අරමුණු

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති යෝජනාඇගයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම
- අවශ්‍ය විටෙක සැලසුම් ක්‍රම යාවත්කාලීන කිරීම
- ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට මාර්ග උපදේශ සැපයීම
- විශේෂ/ කලාපීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය සඳහා ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- නිකුත් කිරීමේ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නිර්දේශිත ව්‍යාපෘති සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීම දක්වා)
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

## 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 9 කට වෙන් කර ඇත. එම අංශ 9 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 9 කට වෙන් කර ඇත. එම අංශ 9 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

### දෙපාර්තමේන්තුවේ අංශ

- සාර්ව ආර්ථික සංවර්ධනය
- කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් හා ධීවර
- කර්මාන්ත සහ වෙළඳ, විදුලිබල හා බලශක්තිය
- මාර්ග, වරාය, ගුවන් සේවා සහ ප්‍රවාහන
- නාගරික සංවර්ධනය, නිවාස, ජලය, පරිසරය සහ ආපදා කළමනාකරණය
- සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා, සංස්කෘතික හා ආගමික කටයුතු
- අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ
- කලාපීය සංවර්ධනය, සංචාරක හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණය සහ පාලනය

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්

දෙපාර්තමේන්තුව යටතට එන ආයතන / අරමුදල් නොමැත

## 1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1. **ව්‍යාපෘතියේ නම:** ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම
2. **ආධාර දෙන ආයතනය:** ලෝක බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** - රු. 325 Mn
4. **ව්‍යාපෘති කාලය:** 2018-2020

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සාර්ව ආර්ථික අංශය

සාර්ව ආර්ථික විද්‍යා අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්බන්ධීකරණය, සකස් කිරීම සහ අධීක්ෂණය කිරීමයි. ඊට අමතරව, ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හා වැඩසටහන් බවට පරිවර්තනය කිරීමේදී දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ආයෝජන සහ දර්ශක මූල්‍යකරණය තීරණය කිරීමට මෙම අංශය උපකාරී වේ. එය ජාතික හා ජාත්‍යන්තර සන්දර්භය විශ්ලේෂණය කරන අතර ආංශික උපාය මාර්ග සැකසීම සහ ආංශික සැලසුම් සමාලෝචනය කිරීම සඳහා වෙනත් අංශවලට පහසුකම් සපයයි.

**ප්‍රගතිය**

- 2020 - 2023 රාජ්‍ය ආයෝජන වැඩසටහනේ පරිච්ඡේද සකස් කිරීම සඳහා වෙනත් අංශවලට සහාය වීම.
- 2019-2022 රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළිබඳ අවශ්‍ය තොරතුරු මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2019 වෙත සැපයීම.
- වර්තමාන ආර්ථික ගැටළු විශ්ලේෂණය කිරීම සහ අදාළ අංශ සඳහා අවශ්‍ය මගපෙන්වීම සැපයීම.

## 2.2 කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් හා ධීවර

**කෘෂිකාර්මික අංශය**

දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය 7% දක්වා සැලකිය යුතු ලෙස අඩු වුවද කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධානතම අංශය වන අතර රැකියා උත්පාදනය හා ජාතියට ආහාර නිෂ්පාදනය කරයි. වසර පුරා පැවති කෝවිඩ් -19 වසංගතය රටේ කෘෂිකාර්මික අංශයට අවම වශයෙන් බලපා ඇත. කෙසේ වෙතත්, සියලු අභියෝග මධ්‍යයේ වුවද, කෘෂිකර්මාන්තයේ රජයේ ප්‍රතිපත්තිය මඟින් කෘෂිකාර්මික අංශය ඉහළ ඵලදායී, තාක්‍ෂණය මත පදනම් වූ, තිරසාර හා ඉහළ ලාභ ලබන අංශයක් වෙත නවීකරණය කිරීම අපේක්ෂා කරන අතර ජාත්‍යන්තර වෙළඳපොලේ කෘෂි පාදක නිෂ්පාදනවල තරඟකාරීත්වය සහ සහතික කරන ලද ආහාර සුරක්ෂිතතාව සහ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ද අපේක්ෂාකරයි.

මෙම පසුබිම තුළ, වෙළඳපල සම්බන්ධතා, පාලනය සහ කෘෂිකාර්මික සේවා සැපයීම යන අංශවල අත්දැකීම් ආමන්ත්‍රණය කිරීම සඳහා සියලු උප අංශ ආවරණය වන පරිදි සමස්ත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය කෙටුම්පත්කර අවසන් කිරීම මෙම වසරේ වැදගත් පියවරක් විය.

**බෝග කෘෂිකර්මාන්තය**

භෝග කෘෂිකර්මාන්තය වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර භෝග (පලතුරු), කුළුබඩු, මල් වගාව සහ විසිතුරු පත්‍ර ඇතුළු අපනයන කෘෂිකාර්මික භෝග වලින් සමන්විත වේ. බෝග කෘෂිකාර්මික

නිෂ්පාදනයේ ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම එහි අපනයනවල තරඟකාරිත්වය සහතික කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා රජය පියවර කිහිපයක් ගෙන තිබේ. වෙනත් ක්ෂේත්‍ර භෝග (OFCs); බඩ ඉරිඟු, අර්තාපල්, ළූණු, රට කජු, මිරිස්, ඉරිඟු (තල), මුං ඇට, මෙනේරි සහ සෝයා බෝංචි යල සහ මහ යන කන්න දෙකෙහිම නිපදවන බහු වාර්ෂික භෝග වේ. ක්ෂේත්‍ර භෝග ප්‍රධාන වශයෙන් කුඩා ගොවීන් විසින් වගා කරනු ලබන අතර ගෙවතු ද ක්ෂේත්‍ර භෝග සැපයීමේ වැදගත් ප්‍රභවයකි. දේශීය ඉල්ලුම සපුරාලීමට දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන අතර දේශීය නිෂ්පාදනයේ සැපයුම් හිඟය පියවා ගැනීම සඳහා වර්තමානයේ බොහෝ ක්ෂේත්‍ර භෝග සමාගම් විසින් ආනයනය කරනු ලැබේ. ඒ අනුව ආනයන වෙනුවට අර්තාපල්, ළූණු, බඩ ඉරිඟු සහ කහ වැනි බෝග බොහොමයක් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා රජය ලබා දී ඇති සහයෝගය තවදුරටත් ශක්තිමත් කර තිබේ.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන්,**

- ව්‍යාපෘති යෝජනා 33 ක් ඇගයීම අවසන්කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිරීක්ෂණ ඉදිරිපත් කළේය.
- කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අදාළ රාජ්‍ය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 10 ක් සඳහා කැබිනට් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්:**

- කෘෂිකාර්මික ප්‍රතිපත්තිය පුළුල් කිරීම - නව රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මූලික ලේඛනය සරල කිරීම හා නැවත සකස් කිරීම සම්පූර්ණ කරන ලදී.
- රජය වෙත බීජ බෙදා හැරීමේ වැඩපිළිවෙල පහසු කිරීම හා අවසන් කිරීම සඳහා වූ යෝජනාවක් සකස් කිරීම, භෝග 16 කින් වැඩි කරන ලද වේගවත් ආහාර ප්‍රවර්ධන වැඩසටහන සහ සාර්ක් මූල්‍යකරණය (CERC financing) යටතේ අරමුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.
- පශ්චාත් COVID අවශ්‍යතා සහ නැගී එන ගැටළු (ADB) විසඳීම සඳහා වූ උපාය මාර්ග සැලකිල්ලට ගනිමින් කෘෂිකාර්මික අංශය සඳහා යෝජනාවක් සකස් කරන ලදී.
- කෘෂිකාර්මික අංශය සඳහා SDG- data tracker (දත්ත ලුහුබැඳීම) ආරම්භ කිරීමට සහාය ලබා දෙන ලදී
- SAPP ව්‍යාපෘතියේ MTR අවසන් කිරීම.
- කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය (සංරචකය 2) ප්‍රතිව්‍යුහගත කිරීම නව රජයේ මුල පිරීම්, රජයේ මූල්‍ය තත්ත්වය සහ COVID-19 සමඟ ඇති වන නැගී එන අවශ්‍යතා වලට අනුකූලව නිම කරන ලදී.

**වාරිමාර්ග හා ඉඩම්**

2020 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 53.7 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 45.6 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් ආරම්භ කොට ඇති මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, කළු ගල් ඔය ජලාශ ව්‍යාපෘතිය, මොරාන ජලාශ ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

2020 දී ඉඩම් අංශයෙහි සමස්ත වියදම රු. මිලියන 9,031 ක් වන අතර එයින් රු. මිලියන 3,175 ක් ප්‍රාග්ධන වියදම් වේ. 2020 දී ඉඩම් හිමිකම් වැඩ සටහන (බිම්සවිය) සඳහා සැලකිය යුතු මුදලක් වැය කර ඇත. 2020 දී රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් හඳුනාගෙන අත්පත් කිරීම සිදු කර ඇත.

**වාරි අංශයට අයත් විශේෂ වැඩසටහන**

- 2021 අයවැය සකස් කිරීම සඳහා වාරිමාර්ග අංශයේ ප්‍රමුඛ ව්‍යාපෘති විශ්ලේෂණය කර ආයෝජනය සඳහා ඉදිරිපත් කිරීම. මෙයට විදේශීය අරමුදල් සහිත ව්‍යාපෘති 11 ක්, වැඩ අවසන් කිරීමට ආසන්න ප්‍රධාන / මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම 13 ක්, පුනරුත්ථාපන හා නඩත්තු කිරීම හා වාරි යෝජනා ක්‍රමවල සූදානම් කිරීම, ඉඩම් හඳුනා ගැනීම, ශක්‍යතා අධ්‍යයන, මූලික අධ්‍යයන කටයුතු ඇතුළත් වේ.

- දේශගුණයට ඔරොත්තු දීමේ බහුකාර්ය වැඩසටහනහි (CREsMP) යෝජනා ජලය මුහුදට ගලා බසිනවාට වඩා ඉහළ ජලාධාර ප්‍රදේශයේ ගබඩා කිරීමේ අභිලාෂයෙන් ප්‍රතිව්‍යුහගත කොට ඵලදායි යාන්ත්‍රණයක් යටතේ පිරිවැය භාවිතය සහතික කිරීමට කටයුතු කිරීම.

- රාජ්‍ය ආයෝජන යෝජනා සමාලෝචනය කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද මූලික වාර්තාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අදහස් දැක්වීම කරන ලදී.

- වාරිමාර්ග අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර පිරිවැය ඵලදායි ලෙස සහ සීමිත සම්පත් උපරිම ලෙස උපයෝගී කර ගැනීම සඳහා ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IW&WRMP) සංරචක සහ පිරිවැය සංශෝධනය කරන ලදී.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්**

1. වාරි අංශයේ ව්‍යාපෘති වාර්තා 11 හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 03 ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.

2. වාර්මාර්ග අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 20 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.

3. මොරකහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂණ ආයෝජන වැඩසටහන, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රියව දායකවීම.

4. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලොචන රැස්වීම්වලට සක්‍රියව දායකවීම.

5. වාරිමාර්ග හා ඉඩම් අංශයට අදාල තොරතුරු සපයමින් රාජ්‍ය ආයෝජන සැලැස්ම (2019-2021) යාවත්කාලීන කිරීමට සහාය වීම.

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා බහුවිධ කාර්යභාරයක් ඉටු කරන අතර ප්‍රධාන වශයෙන් කිරි, කුකුළු මස්, ඌරන්, එළු සහ බැටළුවන්ගේ උප අංශ වලින් සමන්විත වේ. මෙම අංශය දැනට දළ දේශීය නිෂ්පාදිතයට සියයට 0.7 ක් පමණ දායක වන අතර ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කර, රැකියා සපයන අතර ප්‍රජාවේ සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කරයි. කිරි ගොවීන් 250,000 ක් ඇතුළුව පවුල් 600,000 ක් පමණ මෙම අංශයට සෘජුවම සම්බන්ධ වී සිටිති. මේ වන විට සමස්ත ගෘහස්ථ කිරි නිෂ්පාදනය දළ වශයෙන් ලීටර් මිලියන 495 ක් වන අතර එය රටේ ඉල්ලුමෙන් සියයට 40 ක් සපුරාලීමට ප්‍රමාණවත් වේ. එබැවින් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ අපනයනය සඳහා අතිරික්තයක් සමඟ දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකාබද්ධ වාණිජකරණය වූ ගොවිතැනක් සඳහා ආංශීය පරිවර්තනයක් අවශ්‍ය වේ.
කුකුළු කර්මාන්තය පෞද්ගලික අංශය විසින් මුළුමනින්ම මෙහෙයවනු ලබන අතර කුකුළු මස් හා බිත්තර සඳහා ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීමට ද හැකියාව ඇත. මෙම අංශය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කුකුළු සෞඛ්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා රජයේ කාර්යභාරය බොහෝ දුරට සීමා වී ඇත. කුකුළු මස් හා බිත්තර සත්ව ප්‍රෝටීන වල ලාභම ප්‍රභවයක් ලෙස පිළිගෙන ඇති හෙයින්, ජාතියේ සත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා කුකුළු නිෂ්පාදන නිෂ්පාදනය වැඩි කිරීමත්, නිෂ්පාදන පිරිවැය අඩු කිරීමත් අවශ්‍ය වේ. ආසියානු කලාපයේ කුරුළු උණ රහිත රටක් වීමේ වාසිය ලබා ගනිමින් අපනයන වෙළඳපොළ අත්පත් කර ගැනීම සඳහා මෙම කර්මාන්තය දැන් තරඟකාරී තත්වයක සිටී.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන්,

- ව්‍යාපෘති යෝජනා 9 ක් ඇගයීම අවසන්කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේය.
- පශු සම්පත් අංශයට අදාළ කැබිනට් සංදේශ 3 ක් සඳහා කැබිනට් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී

**වැවිලි කර්මාන්ත අංශය**

වැවිලි කර්මාන්ත අංශය, ශ්‍රී ලංකා ආර්ථිකයේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව 2020 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අංශයේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වූ අතර වැවිලි කර්මාන්ත අංශයේ ඉලක්ක එයට සමගාමීව හැඩ ගැසුණි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රාජ්‍ය අමාත්‍යාංශ හතරක් ස්ථාපිත වී ඇති අතර අමාත්‍යාංශයේ  සහ අදාළ ආයතනයන්හී රාජකාරී කටයුතු අමාත්‍යාංශයේ අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය ලෙස සිදු කරනු ලැබිණි. තේ, රබර් සහ පොල් ප්‍රධාන වැවිලි බෝගයන් වන අතර ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත්, උක්, බඩ ඉරිගු සහ කහ සුලු වැවිලි බෝගයන් වේ. වැවිලි කර්මාන්ත අංශය දළ දේශීය නිෂ්පාදනයට දරණ දායකත්වය සියයට 2 ක් පමණ වන අතර ප්‍රධාන වැවිලි බෝගයන් අපනයනය මගින් 2019 වර්ෂයේ ලැබුණු විදේශ විනිමය රුපියල් මිලියන 300 ක් පමණ වේ. වැවිලි ක්ෂේත්‍රෙය් නිෂ්පාදනය වැඩි කිරීම, බෝග විවිධාංගීකරණය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු වී ඇත. වැවිලි අංශයේ කටයුතු කර ගෙන යාම සඳහා 2020 වර්ෂයේදී රුපියල් මිලියන 2,582 ක ප්‍රතිපාදන අයවැය ප්‍රතිපාදන මගින් ලබා දී ඇත.

සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති වාර්තා 48 ක් තක්සේරු කර එ සඳහා වන නිරීක්ෂණ ජාතික අයවැය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇත.

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 4 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇතග

විශේෂ ක්‍රියාකාරකම්

- කුඩා තේ වතු සහ රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීම සඳහා සහභාගී වීම

**ධීවර අංශය**

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ධීවර අංශයේ කටුයුතු සිදු කරන ලදී. මිලියන 2.7 ක පමණ පිරිසක් ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජීවිකාව සලසා ගන්නා අතර ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ධිවර අංශය සුවිශේෂී දායකත්වක් දරයි. ධීවර අංශය දළ දේශීය නිෂ්පාදනයට දරණ දායකත්වය සියයට 1.1 ක් පමණ වේ. 2019 වසරේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 505,803 ක් පමණ වේ. ඒ අතුරින් මෙට්‍රික් ටොන් 415,490 ක් සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය වන අතර ඉතිරිය අභ්‍යන්තර ධීවර අංශයෙන් ලැබේ. 2019 වසරේදී, සමස්ත මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 95,637 ක් වන අතර අපනයනය මෙට්‍රික් ටොන් 28,771 ක් වේ. කෙසේ වුවද, මත්ස්‍ය ආනයනය සඳහා දැරීමට සිදුවූ වියදම එක්සත් ජනපද ඩොලර් මිලියන 218 ක් වන අතර, මත්ස්‍ය අපනයනයෙන් ලද ආදායම එක්සත් ජනපද ඩොලර් මිලියන 299 ක් පමණ වේ. ඒ අනුව, ධීවර අංශය ස්වයංපෝෂිත කිරීම, අපනයන තත්වයන් ඉහල නැංවීමෙන් අපනයන වැඩි කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ අරමුණින් රජය විසින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එම අරමුණු ලගා කර ගැනීම සඳහා ව්‍යාපෘති අනුමත කරන ලදී.

සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති වාර්තා 18 ක් තක්සේරු කර එ සඳහා වන නිරීක්ෂණ ජාතික අයවැය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇත.
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 8 ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

විශේෂ ක්‍රියාකාරකම්

- කලපු සංරක්ෂණය සහ සංවර්ධනය සඳහා වන ව්‍යාපෘතියේ ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීම සඳහා සහභාගී වීම.
- CARP ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීම සඳහා සහභාගී වීම.
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සහභාගී වීම.

## 2.3 කර්මාන්ත හා වෙළඳ, විදුලි බල හා බලශක්ති

**කර්මාන්ත අංශය**

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා කාර්මිකරණයෙන් ඔබ්බට අපේක්ෂා කරන ඉහළ මට්ටමකට රට ස්ථානගත කිරීම සඳහා කර්මාන්ත අංශය විශාල වගකීමක් දරයි. ජාතික ආර්ථිකයේ තීරණාත්මක කොටසක් වන මෙම අංශය, 2019 සංඛ්‍යාලේඛනවලට අනුව, දළ දේශීය නිෂ්පාදිතයට ආසන්න වශයෙන් 26% ක දායකත්වයක් ලබාදෙන අතර සමස්ත සේවා නියුක්තියෙන් 28% ක් සහ මුළු අපනයන ඉපැයීම් වලින් 78% ක් ආවරණය කරයි. කාර්මික අංශයේ විශාලතම ප්‍රතිශතය නිෂ්පාදන ව්‍යාපාරවලින් සමන්විත වන අතර එය එම අංශයේ සමස්ත ප්‍රතිදානයෙන් සියයට 17 කට වඩා අධිකය. කාර්මික අංශයේ තවදුරටත් දියුණු කිරීම හා ශක්තිමත් කිරීම අවශ්‍ය වන ප්‍රධාන ක්ෂේත්‍රයන් ලෙස ව්‍යාපාර හා ව්‍යවසායකත්ව

සංවර්ධනය, ඇඟලුම් කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආදී ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඇත. මෙවන් පසුබිමක, එකී විභව කාර්මික ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබයි. තවද, කර්මාන්ත අංශයට අදාළ ව්‍යාපෘති යෝජනා සඳහා පූර්ව ඇගයීම් ක්‍රියාවලියට සම්බන්ධ වන අතරම, ආංශික මූල්‍යකරණයටද මෙම දෙපාර්තමේන්තුව මැදිහත් වේ.

මෙරට කාර්මික අංශය වැඩිදියුණු කිරීමේ අරමුණට අනුකූලව 2020 වර්ෂයේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් අවසන් කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 65 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති යෝජනා ඇතුළත් ව්‍යාපෘති පෙළගැස්ම (Project Pipeline) යාවත්කාලීන කිරීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන සහ විදේශ දූත මණ්ඩල ඇතුළු රැස්වීම්වලට සක්‍රීයව සහභාගී වීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලව සුදුසු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවලට අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳ පැවති වැඩමුළු හා රැස්වීම්වලට සහභාගී වීම සහ ඒ සඳහා අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.

**වෙළෙඳ අංශය**

ජාතික සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව වෙළෙන්දන්, සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ.

මේ සඳහා ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් තුළින් වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම; අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම; රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම; ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ සෞඛ්‍ය හා පාරිසරික තිරසරභාවය සුරකිමින් ආනයන සහ අපනයන කටයුතු නියාමනය කිරීම.

**කම්කරු අංශය**

ශ්‍රමය යනු නිෂ්පාදනයේ සාධක හතරෙන් එකක් වන ආර්ථිකයක වැදගත් සාධකයකි. ශ්‍රමයේ ගුණාත්මකභාවය ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව තීරණය කරයි. තවද, සේවකයින්ට ගෙවනු ලබන සේවා කොන්දේසි සහ වේතනය ජනතාවගේ ජීවන තත්ත්වය සහ සමාජ යහපැවැත්ම තීරණය කරයි. ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකාය මිලියන 8.6 ක් පමණ වන අතර එය ජනගහනයෙන් සියයට 40 කට

සමාන වේ. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ සහභාගීත්වය 2019 දී සියයට 52.3 ක් වන අතර එය පිරිමින් සඳහා සියයට 73 ක් සහ කාන්තාවන් සඳහා සියයට 34 කි. ඉහළ රැකියා ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ සේවකයින් (43%) සහ ස්වයං රැකියාවල නියුක්ත (තමන්ගේම ගිණුම් සේවකයින්) (32.5%) නියෝජනය කරයි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සමස්ත සේවා නියුක්තියෙන් සියයට 14.9 කි.

**විශේෂ කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ සඳහා කැබිනට් නිරීක්ෂණ 01ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 03 ක් ඇගයීමට ලක් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තෙමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තෙමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**විදුලිබල හා බලශක්ති අංශය**

විදුලිබල හා බලශක්ති අංශය විදුලිබල සහ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජනය කරයි. බොර තෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා, වාර්ෂිකව රු. මිලියන 660,000 වැය කරනු ලැබේ. දැනට පවත්නා මුළු විදුලි උත්පාදනය සහ රටේ ස්ථාපිත ධාරිතාව පිළිවෙලින් ගිගාවොට් පැය 16,000 සහ මෙගාවොට් 4217 කි. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය සැලකීමේදී එය කිලෝවොට් 670 kW/h වන අතර, රටේ වාර්ෂික විදුලි ඉල්ලුම 5.5% ක ප්‍රතිශතයකින් ඉහළ යනු ලැබේ. එසේම සූර්ය බලශක්තිය මත පදනම් වූ විදුලි උත්පාදනය සලකා බැලීමේදී, ශ්‍රී ලංකාවට සූර්ය බලශක්තියේ සැලකිය යුතු විභවයක් පවතී( එනම්, සාමාන්‍යයෙන් දිනකට සූර්ය විකිරණ, ඒකක වර්ග මීටරයකට කිලෝවොට් පැය 4 - 4.5 අතර ප්‍රමාණයක්). අපේක්ෂිත ආර්ථික වර්ධනයත් සමඟ කර්මාන්ත හා සේවා අංශවලින් විදුලිබල හා බලශක්ති අංශයට ඇති ඉල්ලුම ද අඛණ්ඩව ඉහළ යනු ඇත. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ මෙම ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අවශ්‍ය පියවර රජයහි වර්තමාන ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගත වෙමින්, පුනර්ජනනීය බලශක්තිය මගින් විදුලි ජනනය මූලික කර ගෙන සිදු කිරීමට අපේක්ෂා කෙරේ .

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමේ මෑත කාලීන ප්‍රවණතාව රජය විසින් ද ප්‍රවර්ධනය කර ඇත. ඒ අනුව, විදුලිබල උත්පාදන ප්‍රභවයන් ගල් අඟුරු, ස්වාභාවික වායු, ජල හා තෙල් වැනි සම්ප්‍රදායික ප්‍රභවයන්ගේ සිට සූර්ය, සුළං, සාගර තරංග, භූතාපජ හා ජෛව ස්කන්ධ වැනි සම්ප්‍රදායික නොවන ප්‍රභවයන් දක්වා විහිදේ. මෙම අංශයේ ''කාබන් මධ්‍යස්ථභාවය'' උල්ලංඝනය නොකර විදුලිබල හා බලශක්ති අංශය සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද පූර්ණ සහයෝගය ලබා දී ඇත. 2020 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි දායකත්වය පහත පරිදි සාරාංශගත කළ හැකිය.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- ''ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය'' පිළිබඳ කැබිනට් සංදේශය ඇතුළුව කැබිනට් සංදේශ 13 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.
- ශ්‍රී ලංකාවෙහි න්‍යෂ්ටික බලශක්ති සංවර්ධන වැඩසටහන පිළිබඳ කමිටුවල කටයුතු කිරීම.

- ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය  සකස් කිරීමේදී තාක්ෂණික සහාය ලබා දීම.
- "ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග" පිළිබඳ මහජන අදහස් විමසීමේදී එය වැඩි දියුනු කිරීම සඳහා කරුනු දැක්වීම.

## 2.4 ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා ගුවන් සේවා

රට තුළ සහ ලෝකයේ සෙසු රටවල් සමඟ මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා කාර්යක්ෂම ප්‍රවාහන සේවා සැපයීම මෙම අංශවල ප්‍රධාන කාර්යය වේ. සුපුරුදු පරිදි, ආයෝජන සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර වනුයේ අධිවේගී මාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා පුනරුත්ථාපනය කිරීම, මාර්ග නඩත්තු කිරීම සහ පාලම් ඉදිකිරීම, නවීකරණය තුළින් පොදු ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම, නාගරික ග්‍රාමීය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම, නාගරික මාර්ග තදබදය අඩු කිරීම, මාර්ග අනතුරු අවම කිරීම, වරාය සහ ගුවන් තොටුපල යටිතල පහසුකම් පුළුල් කිරීම 2020 කාලය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

**විශේෂිත වූ කාර්යයන්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් 16 ක් ඇගයීම.
- මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය, වරාය හා නාවික අමාත්‍යාංශය හෝ මාර්ග, ප්‍රවාහන, වරාය සහ ගුවන් සේවා සම්බන්ධ කැබිනට් සංදේශ ඉදිරිපත් කළ ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ සකස් කිරීම. කැබිනට් සංදේශ සඳහා මුළු කැබිනට් නිරීක්ෂණ 21 ක් ඉදිරිපත් කරන ලදී.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.
    - පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
        - ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය, ජාතික මාර්ග ප්‍රතිපත්තිය, ජාතික වරාය සහ සමුද්‍රීය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීම
        - බස් ගාස්තු සංශෝධනය කිරීම සහ බස් බලපත්‍ර නිකුත් කිරීම
        - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා අදහස් දැක්වීම.

## 2.5 නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර

**නාගරික සංවර්ධන හා නිවාස අංශය**

නාගරික සංවර්ධන හා නිවාස අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා සම්බන්ධව කටයුතු කරමින් රට තුළ නාගරික යටිතල පහසුකම් ස්ථාපිත කිරීමටත්, පවතින පහසුකම් විධිමත් ලෙස සකස් කිරීමටත්, විවිධ වූ ප්‍රවේශයන් යටතේ සැමට නිවාස පහසුකම් ලබා දීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනයටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය දායකත්වය සපයනු ලබයි. රටක ආර්ථිකයට

සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබන්නේ ආර්ථික විභවතාවයන් ඒකරාශී වී පවතින නාගරික ප්‍රදේශයන් විසිනි. අපේ රටේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් දැනටමත් ජීවත් වන්නේ නාගරීකරණය වූ ප්‍රදේශවල ය. කෙසේ වෙතත්, නාගරීකරණය මැනීම සඳහා සුදුසු ස්ථාපිත නිර්ණායක නොමැති වීම නිසා රටේ නාගරීකරණ ප්‍රතිශතය නිවැරදිව තක්සේරු කිරීම දුෂ්කර ය. නගර තුළ පවතින සංවර්ධන විභවතාවයන් හඳුනා ගැනීම අනාගත ආයෝජන විධිමත් ලෙස ස්ථානගත වීම සඳහා අවකාශ සලසනු ලබයි. එමනිසා, තිරසාර නාගරීකරණයට ඇති බාධාවන් අවම කිරීමට සහ ආර්ථිකයේ නියමිත ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා ක්‍රමානුකූලව, අන්තර් සම්බන්ධිතව හා ප්‍රවේශ විය හැකි පරිදි නාගරික සංවර්ධනය හැඩ ගැස්විය යුතු ය.

රටේ පවුල් මිලියන 6ක් අතරින් කිසියම් ආකාරයක නිවසක් ඇත්තේ මිලියන 5.2ක් සඳහා පමණි. එබැවින්, තමන්ගේ ම නිවසක් නොමැති පවුල් සංඛ්‍යාව 800,000 ඉක්මවයි. එසේම, වර්තමාන නිවාස සංඛ්‍යාවෙන් 300,000කට ආසන්න ප්‍රමාණයක් තාවකාලික එකලස් කිරීම් බැවින් මෙම ගැටළුව තවදුරටත් තීව්‍ර වී තිබේ.

එබැවින්, තිරසාර නාගරීකරණයක් ඇති කිරීම සඳහාත්, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහාත්, නිවාස පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහාත් නාගරික ප්‍රදේශ සහ නිවාස විධිමත්ව හා මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනය කිරීමට ඉවහල් වන ව්‍යාපෘතීන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සැලසීමට සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීමට මෙම අංශය දායකත්වය සපයනු ලැබේ.

**ක්‍රියාකාරකම්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 21ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- නාගරික සංවර්ධනය හා නිවාස සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 25ක් ඇගයීමට ලක් කර අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීම
- නාගරික සංවර්ධන හා නිවාස අංශයට අදාළ වාර්තා සකස් කිරීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම
- අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කෙරෙන විවිධ ව්‍යාපෘති තුළ හඳුනාගත් ගැටළු නිරාකරණය කිරීම සඳහා හවුල්කරුවන් සමග සාකච්ඡා පැවැත්වීම සහ සංවර්ධන අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමට අවශ්‍ය දායකත්වය ලබාදෙමින් එම කටයුතු ජාතික සංවර්ධන න්‍යාය සමග අනුගත කිරීම
- රේඛීය ආයතන දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

**ජල සම්පාදනය හා සනීපාරක්ෂාව**

පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා සමාජ ආර්ථික අවස්ථාවන් සඳහා පමණක් නොව තිරසාර සංවර්ධන ඉලක්ක 6 යටතේ දක්වා ඇති අරමුණු ඉටු කරගැනීම සඳහා ද අත්‍යවශ්‍ය වේ. තිරසාර ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා, රටේ සමස්ථ ජනතාවට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා වැඩි ප්‍රවේශයක් අවශ්‍ය

වේ. "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති රාමුව මගින් ඉදිරි සිව් වසර තුල රටේ සමස්ථ ජනතාවට පිරිසිදු පානීය නළ ජලය ලබා දීම ප්‍රමුඛතා අංශයක් ලෙස හදුනාගෙන ඇත.
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජල සම්පාදන අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආංශීය පාර්ශවකරුවන් සමඟ සමීපව වැඩ කටයුතු කරන අතර ආංශීය ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් සහ මඟ පෙන්වීම් මෙම ආයතන වලට සැපයීම සිදු කරනු ලැබේ. තවද, මෙම වසර තුළ පහත දැක්වෙන ආංශීය කාර්යයන් මෙම අංශය මගින් නිම කර ඇත.

1. ජල සම්පාදන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද පහත ව්‍යාපෘති යෝජනා මූලික අධ්‍යයනය සිදු කර ඒවා සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අදහස්, නිරීක්ෂණ හා ව්‍යාපෘති වලට අදාළව සකස් කරන ලද නිර්දේශ වාර්තා අදාළ පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

   I. **නිර්දේශිත ව්‍යාපෘති**
      - විසල් ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කෙටිකාලීන ජල සම්පාදන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1
      - ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මුල්‍යනය
      - රට තුල නළ ජල ආවරණය වැඩි කිරීම සඳහා වන ව්‍යාපෘතිය.

   II. පහත ව්‍යාපෘති පරීක්ෂා කිරීමෙන් හා ඇගයීමෙන් පසු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් හා පැහැදිලි කිරීම් රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.
      - කුරුණෑගල ප්‍රදේශයේ ජනතාවට දේශගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පානීය ජල සැපයුම් යෝජනාව
      - දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය - අතිරේඛ මුල්‍යනය
      - කොළඹ උතුරු ප්‍රදේශය සඳහාවන අපජල කළමණාකරන ව්‍යාපෘතිය
      - ගැටබේ ජල පවිත්‍රාගාරය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය
      - හම්බේගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය
      - අපජල සම්බන්ධතා වැඩි කිරීම, සේවා සැපයීම , පවත්නා අපජල යෝජනා ක්‍රමවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
      - නගර සඳහා වන සනීපාරක්ෂණ ව්‍යාපෘතිය - මීගමුව නගරය සඳහා වන අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - අදියර II
      - විෂය පථය වෙනස්වීම - විසල් ගාල්ල හා ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කෙටිකාලීන වැඩිදියුණු කිරීම - අදියර I

2. අදාල අමාත්‍යාංශය මගින් යොමු කරන ලද පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ වලට ආදාළව නිරීක්ෂණ/ අදහස් සකස් කිරීම.
   - 2025 වන විට සැමට පානීය ජලය හා අපජල පහසුකම් ආවරණ අනුපාතය 3.07% දක්වා වැඩි කිරීමේ උපායමාර්ගික සැලැස්ම.
   - එප්පාවල, රාජාංගනය, නොච්චියාගම, ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය

- විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන-අදියර III
- ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කාලය දීර්ඝ කිරීම
- යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යනය ,( ඒ.ඩී .බී.), යාපනය දිස්ත්‍රික්කයේ තලයියඩි ප්‍රදේශයේ RO ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම

3. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති හා සම්බන්ධ විදේශීය දූත මණ්ඩල ප්‍රාරම්භක රැස්වීම්, අවසන් රැස්වීම් හා ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් වලට සහභාගී වීම.

4. විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන සියලුම ව්‍යපෘති සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා ජල සම්පාදන අංශය යටතේ ක්‍රියාත්මක වන සවිස්තරාත්මක ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම හා එම රැස්වීම් සඳහා සහභගී වීම.

**පරිසර කළමනාකරණය ආපදා කළමනාකරණය**

නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සපසන අතරතුර, පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම, කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ ස්වාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. තුලිත සමාජ, ආර්ථික හා පාරිසරික භාවිතයන් තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පාරිසරික කළමනාකරණය ඉතා වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වන ජෛව විවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

එසේම රට තුළ ස්වාභාවික විපත් ඇති වීමේ ප්‍රවණතාවය සීඝ්‍රයෙන් ඉහළ යන අතර, එය මිනිස් ජීවිත හා දේපළ වලට දැඩි හානි සිදු කිරීමට හේතු වී ඇත. තවද රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව සම්පත සෘජු දායකත්වය සපයන බැවින්, රටේ ජනතාව අපදාවන්ගෙන් බේරා ගැනීම අතිශය වැදගත් කාර්යයක්ව පවතී. එබැවින්, රට තුල ස්වාභාවිකව හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වන ආපදාවන්, ඵලදායී ලෙස වළක්වාගැනීම හා පාලනය කිරිම තුළින් ඔවුන්ගේ ජීවිතවල සමගිය, සමෘද්ධිය සහ අභිමානය සඳහා පහසුකම් සලසමින් ප්‍රජාව රැකබලා ගැනීම සඳහා රජය තිරසාර හා කඩිනම් පියවර ගෙන තිබේ.

**විශේෂ අවස්ථා**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 20 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 21 ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2020 - 2022 යාවත්කාලීන කිරීමට සහාය ලබාදීම

- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

## 2.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික

**සෞඛ්‍ය අංශය**

සෞඛ්‍ය ක්ෂේත්‍රයට මෙන්ම රටෙහි සුමට ක්‍රියාකාරීත්වය සඳහා කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පෙර නොවූ විරූ ලෙස බලපෑම් එල්ල විය. ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි ආධාර සපයන ආයතන වල සහයෝගයද ඇති ව වසංගතය සඳහා සූදානම් වීම, බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා පුද්ගලික ආරක්ෂක උපකරණ ලබා දීම සඳහා රජය විසින් ඉතා විශාල ලෙස ආයෝජන සිදු කරන ලදී.මෙම වසංගත කාලය තුළ දී සෞඛ්‍ය අංශය හා සෞඛ්‍ය සත්කාර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්ති සංශෝධන වලට මුල පුරනු ලැබිණි. 2020 වර්ෂයේ දී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව පහත කාර්යයන් ඉටු කරන ලදී.

ක්‍රියාකාරකම්

- ව්‍යාපෘති යෝජනා 12 ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- සෞඛ්‍ය අමාත්‍යාංශය ,ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය සඳහා වන රාජ්‍ය අමාත්‍යාංශය හා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 සඳහා නිරීක්ෂණ සපයා ඇත.

- සෞඛය අංශය සඳහා ඉදිරි වර්ෂ තුල ක්රියාත්මක කිරීමේ අරමුණින් යෝජනාවී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ/ ලෝක සෞඛ්‍ය සංවිධානය , ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කිරීම.

**ක්‍රීඩා අංශය**

වසර 2020 තුළ, රජය ක්‍රීඩාංගන ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය, කෘතිම පථ පිහිටුවීම ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සහ ක්‍රීඩා උපකරණ බෙදා දීම ඉලක්ක කර ගනිමින් ක්‍රීඩා ක්ෂේත්‍ය මත ආයෝජනය සිදු කර ඇත.

බෝ නොවන රෝග සඳහා රජයේ වියදම් අඩු කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම සහ ක්‍රීඩාව රටේ සංස්කෘතියේ හා සමාජයේ අනිවාර්ය අංගයක් බවට පත්කිරීම තුලින් සමස්ත ජනගහනය ආවරණය වන පරිදි සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම ඉලක්ක කිරීම අරමුණු කර ඇත..

යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

- Projects ව්‍යාපෘති යෝජනා 04 ක් තක්සේරු කරන ලද අතර අදාළ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 3 ක් සඳහා නිරීක්ෂණ ගබා දෙන ලදී.
- 2019-2021 රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය සහ වෙනත් අදාළ ආයතන සමඟ රැස්වීම් පැවැත්වීම

## 2.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ

**අධ්‍යාපන අංශය**

මානව සම්පත් සංවර්ධනය රටේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා මූලික මෙවලමක් ලෙස හඳුනාගෙන ඇත. හොඳින් සංවර්ධිත මානව සම්පත රට දැනුම පදනම් කරගත් ආර්ථිකයක් වෙත ළඟා වීම සහතික කරයි. මෙම සන්දර්භය තුළ, ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සුසංයෝගයෙන් ගොඩනැගූ සාමාන්‍ය අධ්‍යාපනය නැගී එන ගෝලීය ආර්ථික අවශ්‍යතා සමග තරග කිරීමේ හැකියාවක් ඇති ළමා පරපුරක පෞර්ෂත්වය වර්ධනය කිරීම සඳහා ස්ථිර පදනමක් ඇති කර ලීම සඳහා වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි. 2020 දී මධ්‍යම රජය විසින් කරන ලද ආයෝජනය රු. මිලියන 25,753 ක් වූ අතර එය රු. 2019 දී මිලියන 28,422 ක් විය. කෙසේ වෙතත්, 2020 වසරේදී ගොඩනැගිලි ඉදිකිරීම් සහ පර්යේෂණ හා සංවර්ධන මත වූ ප්‍රාග්ධන වියදම පුමුඛතාවය පදනම් කර ගත් ක්‍රමවේදයක් මත ලබා දීම නිසා ඉහළ ගොස් ඇත.

**පාසල් අධ්‍යාපනය**

2016 වසරේ සිට 2020 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ළඟම පාසල හොදම පාසල වැඩසටහන මගින් ගුණාත්මක අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම අරමුණු කර ගනිමින් නව ගොඩනැගිලි ඉදිකර දීම සහ සුබසාධන පහසුකම් ප්‍රවර්ධනය කිරීම දියත් කරන ලදී. මීට අමතරව, කුසලතා සහ දැනුමෙන් සවිබල ගැන්වූ දරුවන් සමාජගත කිරීමේ අරමුනින් පාසල් සිසුන් සඳහා හඳුන්වා දෙන ලද සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය 2020 වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවදුරටත්, '13 Years of Education' වැඩසටහන නිදහස් අධ්‍යාපනයේ වෘත්තීමය හැරවුම් ලක්ෂය යන තේමාව යටතේ ක්‍රියාත්මක කර ඇත. තවදුරටත්, ද්විතියික අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ක්‍රියාත්මක කර ඇති අතර දේශීය ආධාර යටතේ ජාතික පාසල් 1,000ක් දක්වා වැඩි කිරීමක් සිදු කර ඇත. ස්මාට් අධ්‍යාපනය පිළිබඳ සංකල්පය කොරෝනා ගෝලීය වසංගත තත්ත්වයට මුහුණ දීමේ මගක් ලෙස සංවර්ධනය කරන ලදී.

***ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්***

- අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ ආයතන සමග සාමාන්‍ය අධ්‍යාපන අංශයේ ඉදිරි මග හා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන් (ESDP) සංවිධානය කිරීම, සහභාගී වීම සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සඳහා සහභාගී වීම

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05කට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා සාමාන්‍ය අධ්‍යාපනය හා සම්බන්ධ නව ව්‍යාපෘති යෝජනා හා වැඩසටහන් 05ක් ඇගයීම

**උසස් අධ්‍යාපන අංශය**

රාජ්‍ය විශ්ව විද්‍යාල සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ වීමේ අනුපාතය ඉහළ නැංවීම සහ රාජ්‍ය විශ්ව විද්‍යාල බොහොමයක් සඳහා නව පීඨයන් හා ගොඩනැගිලි ස්ථාපිත කිරීම මගින් උසස් අධ්‍යාපන අංශය 2020 දී පුළුල් ලෙස ව්‍යාප්ත විය. ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවල දේශන ශාලා, නේවාසිකාගාර, පුස්තකාල, රසායනාගාර සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යොදා ගන්නා ලදී. කොළඹ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය පිහිටුවීම, නගර විශ්ව විද්‍යාල පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනය, පිළිකා රෝග විනිශ්චය සඳහා යොමු කිරීමේ මධ්‍යස්ථානයක් සහ නිරවද්‍ය සෞඛ්‍ය පර්යේෂණ ඇතුළු පර්යේෂණ යෝජනා 28 ක් සිදු කර ඇත. තවද, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍රයන් සඳහා විදේශීය පරිත්‍යාගශීලීන්ගෙන් ලද පර්යේෂණ ප්‍රදානයන් වඩාත් ගුණාත්මක උපාධිධාරීන් බිහිකිරීමට සහ උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් නිර්දේශ කිරීම සිදු කර ඇත.

2020 වර්ෂය තුළදී, රටේ සිසුන්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීම සහ මෙම ආයතන පුලුල් කිරීම සඳහා බොහෝ පියවරයන් රැසක් ගන්නා ලදී.

*ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්*

- උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ නව ව්‍යාපෘති සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීම
- විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති වල දූත කණ්ඩායම් සමග පැවැත්විය යුතු සාකච්ඡා සංවිධානය හා මෙහෙය වීම සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම
- උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කළ නව ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම
- උසස් අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ 22 ක් සහ ව්‍යාපෘති යෝජනා 28ක් නිර්දේශ කිරීම

**තොරතුරු සහ සන්නිවේදන අංශය**

ජාතික සංවර්ධනයේ ප්‍රධාන නියමුවා වශයෙන් තොරතුරු සහ සන්නිවේදන අංශය විධිමත් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, වෙළඳපොළ ක්‍රියාවලීන් හා රාජ්‍ය යාන්ත්‍රනය සරල කිරීමත් සමඟම කාර්යක්ෂම සහ පුරවැසි කේන්ද්‍ර කරගත් සේවාවක් සැපයීම, දැනුම හුවමාරු කර ගැනීමේ උපකරණයක් ලෙස තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් ඩිජිටල් පාලනය පුලුල් කිරීම, අන්තර්ජාතික ඉ -ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීම සහ දත්ත ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව සහ

බුද්ධිමය දේපළ අයිතිය සඳහා නව නීති සහ ආයතනික කාර්ය රාමු නිර්මාණය කිරීම සඳහා ජාතික ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. ඊට අනුකූලව, අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව පද්ධතීන් යාවත්කාල කිරීම අරමුණු කරගත් යටිතල පහසුකම් හා සම්බන්ධ සේවාවන් ලබා දීමේදී පෞද්ගලික අංශය වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබන අතරම තොරතුරු සන්නිවේදන පහසුකම් පුලුල් කිරීම, තොරතුරු හා තාක්ෂණය සඳහා ප්‍රවේශය, ඉ- පාලනය හා නියාමන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ද විවිධ පියවරයන් ගෙන ඇත.

**ඉටු කරන ලද කාර්යයන්**

1. අදාල රේඛීය අමාත්‍යාංශවලින් එවන ලද ව්‍යාපෘතීන් හා වැඩසටහන් 04ක ඇගයීම් සිදු කිරීම.
2. තොරතුරු සහ සංනිවේදන අංශයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ 01ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
3. අදාල අමාත්‍යාංශ හා රජයේ ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.

**විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අංශය**

රටක ඉහළ ජීවන තත්ත්වයක් හා වඩාත් ගුණාත්මක ජීවිතයක් ළඟා කර ගැනීම සඳහා තරඟකාරීත්වය හා ඵලදායීතාවය වැඩි දියුණු කිරීමට විද්‍යාත්මක, තාක්ෂණික හා නවෝත්පාදනවලට හැකියාව ඇත. ඊට අනුකූලව, මෙම අංශය තුල රජයේ ප්‍රධාන අරමුණ වන්නේ ඉල්ලුම් පාදක කර ගත් පර්යේෂණ, පර්යේෂණ වාණිජකරනය, නවෝත්පාදන ප්‍රවර්ධනය, ප්‍රමිතීන් සහ සහතිකකරනය සඳහා පහසුකම් සැලසීම වැනි කටයුතුවල නියැලීමට රජයේ පර්යේෂණ ආයතනවලට නිසි මඟ පෙන්වීමක් ලබා දීමයි. මෙම කාර්යය ඉටු කිරීම උදෙසා පර්යේෂණ, පර්යේෂණ සඳහා මූල්‍යායනය හා සංවර්ධන ආයතන අතර සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇත.

**ඉටු කරන ලද කාර්යයන්**

1. අදාල රේඛීය අමාත්‍යාංශවලින් එවන ලද ව්‍යාපෘතීන් හා වැඩසටහන් 6ක ඇගයීම් සිදු කිරීම.
2. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අංශයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ 01ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
3. අදාල අමාත්‍යාංශ හා රජයේ ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.

**කුසලතා අධ්‍යාපනය සහ තරුණ කටයුතු අංශය**

රටක සිත් ගන්නා සුළු ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ඉහළ කුසලතාවන්ගෙන් පිරි ශ්‍රම බලකායක් සිටීම අත්‍යවශ්‍ය බැවින්, වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුව තුල රටෙහි ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ නියමුවන් වශයෙන් පුරවැසියන්ගේ දැනුම, කුසලතාවය හා හැකියාවන්ගේ වැදගත්කම සඳහා සැලකිය යුතු ස්ථානයක් ලබා දී ඇත. ඒ අනුව, වේගයෙන් විකාශනය වන දේශීය

සහ ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඉහළ වේතනයක් අපේක්ෂා කරන පුහුණු පුද්ගලයින්ට සහ පිබිදෙන කාර්මික අවශ්‍යතාවන්ට අනුකූලව පුහුණු ශක්තිමත් ශ්‍රම බලකායක් බිහි කිරීම රජයේ ඉලක්කය වී ඇත.

**ඉටු කරන ලද කාර්යයන්**

1. ඇගයීම් සිදු කිරීම සඳහා තරුණ සංවර්ධන සහ කුසලතා සංවර්ධන අංශයට අදාල ව්‍යාපෘති යෝජනාවලීන් 11ක් ලද අතර එයින් යෝජනාවලීන් 07ක් සඳහා නිසි ලෙස සධාරණීකරනය කරන ලද ඇගයීම් වාර්තා ජාතික අයවැය දෙපාර්තතමේන්තුවට/විදේශ සම්පත් දෙපාර්තතමේන්තුවට සහ අදාල රේඛීය අමාත්‍යාංශවලට ලබා දීම.

2. කුසලතා අධ්‍යාපනය සහ තරුණ කටයුතු අංශයට අදාලව අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.

3. කුසලතා සංවර්ධන අංශයට අදාල අමාත්‍යාංශ හා රජයේ ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය

## 2.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ

**ප්‍රාදේශීය සංවර්ධන අංශය**

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මඟින් අවධාරණය කෙරේ. ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරිමේදී පළාත් 9 තුළ පවතින මූලික සංවර්ධන ගැටළු, විෂමතාවන් හා අභියෝගයන් පිළිබඳව අනාවරණය වේ. ඒවා අතුරින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් කෙරෙහි අවධානය යොමු කිරිම ඉතා වැදගත්වන අතර එය අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය, මානව සංවර්ධන දර්ශකය, කාර්මීකරණ මට්ටම, කෘෂිකාර්මික හා යටිතල පහසුකම් සංවර්ධන මට්ටම යන කාරණා සමඟ සමීපව බැඳී පවතී.

හුදකලා ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ගම සංවර්ධනය කිරීමට පෙර දැරූ සියලු උත්සාහයන් සහ ජාතික සංවර්ධන වැඩසටහන කෙලින්ම ගමට සම්බන්ධ කිරීමට ගත් උත්සාහයන් අසාර්ථක වී ඇත. ප්‍රාදේශීය සංවර්ධනයේ රජයේ දැක්ම වන්නේ ගමේ සංවර්ධනය ප්‍රාදේශීය සංවර්ධනය සමඟ සම්බන්ධ කිරීමයි. නගර නාගරික ප්‍රදේශ ලෙස වර්ධනය වන විට සහ ගම් කලාපීය ප්‍රදේශ ලෙස වර්ධනය වන විට රට සමස්තයක් ලෙස සංවර්ධනය වනු ඇත.

සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන් හී අවධානය යොමු වී ඇත.කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරිම, ගම් උදාව වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම, ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරිම, ගම නැගුම හා පුරනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශිය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන්

කිහිපයකි. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

**විශේෂ කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ සඳහා කැබිනට් නිරීක්ෂණ 02ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 01 ක් ඇගයීමට ලක් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**සංචාරක අංශය**

සංචාරක අංශය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කර්මාන්තයක් ලෙස පිළිගෙන ඇති අතර එය ආර්ථිකයට ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මාර්ගයක් ලෙස 2019 දී ඇමරිකානු ඩොලර් මිලියන 3,607 ක දායකත්වයක් ලබා දී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට සංචාරක කර්මාන්තයේ දායකත්වය 2019 දී සියයට 4.3 ක් විය. කෙසේ වෙතත්, 2018 ට සාපේක්ෂව 2019 දී පාස්කු ප්‍රහාරය හේතුවෙන් සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම් ඇමරිකානු ඩොලර් මිලියන 4,381 සිට 17.7% කින් සහ සංචාරකයින්ගේ පැමිණීම මිලියන 2.334 සිට 18% කින් අඩු වී තිබේ.

විදේශ විනිමය ඉපැයීම් සහ පහසුවෙන් සංවර්ධනය කළ හැකි ක්ෂේත්‍රයක් වන සංචාරක කර්මාන්තය ආර්ථිකයේ වැදගත්ම අංශයක් ලෙස සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව තුල හඳුනාගෙන තිබේ. සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයීම් ඇමරිකානු ඩොලර් බිලියන 10 දක්වා ඉහළ නැංවීමටත්, සංචාරකයින්ගේ පැමිණීම මිලියන 7 දක්වා වැඩි කිරීමටත්, දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වාත්, 2025 වන විට සංචාරක කර්මාන්තයේ මිලියන 1 දක්වා සේවකයින් සංඛ්‍යාව වැඩි කිරීමටත් ඉන් අපේක්ෂා කෙරේ.

**විශේෂ කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ සඳහා කැබිනට් නිරීක්ෂණ 03ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 01 ක් ඇගයීමට ලක් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**සමාජ ආරක්ෂණ අංශය**

සමස්ත සමාජ ආරක්ෂණ අංශය සඳහා පුළුල් ඒකාබද්ධ උපාය මාර්ගයක් සැකසීමට සහ කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු සමාජයේ අවශ්‍ය සියලු කොටස් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය

නංවාලීම සහ ඔවුන් සවිබල ගැන්වීම තුලින් රටේ සංවර්ධනයට දායක කර ගැනීම සඳහා නිශ්චිත සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට රජය සිය සම්පූර්ණ උත්සාහය දරයි.

සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය ළමුන්, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි කොටස්වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකීම දරයි ප්‍රධාන අමාත්‍යාංශ වේ..

සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා සඳහා ඇගැයීම් වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ සකස් කිරීම - ව්‍යාපෘති යෝජනා සඳහා තක්සේරු වාර්තාවක් අයවැය දෙපාර්තමේන්තුවට සහ අදාළ අමාත්‍යාංශවලට ඉදිරිපත් කරන ලදී. අදාළ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 2 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.
- ජාතික සමාජ ආරක්ෂණ උපාය මාර්ග සඳහා පරතර විශ්ලේෂණය (**Gap analysis report**) සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ ඇගයීම - පහත සඳහන් ප්‍රතිපත්ති සමාලෝචනය කර නිරීක්ෂණ ලබා දෙන ලදී.
  - මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තිය
  - COVID- 19 සැලැස්ම

- පහත ව්‍යාපෘති සඳහා අදහස් දැක්වීම් ලබා දී ඇත.
  - “දකුණු ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමාජ ඇතුළත් කිරීමේ ප්‍රතිඵල වැඩි දියුණු කිරීම” සඳහා වන ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතිය
  - “තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජ ආරක්ෂණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය වැඩි දියුණු කිරීම” සඳහා වන ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතිය
  - “SDG programmatic Bond “ සඳහා වන එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන
- රැස්වීම් හා වැඩමුළු සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම - සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දෙන ලදී.

## 2.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන

රාජ්‍ය කළමනාකරණය සහ යහපාලන අංශයේ ව්‍යාපෘති යෝජනා ඇගයීමේ කාර්යභාරය ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රතිපත්තීන්ට අනුකූලව ක්‍රියාත්මක කරන ලදී.

නවීන තාක්‍ෂණය, නවෝත්පාදන හා යහපාලනය පදනම් කර ගත් ජනතා කේන්ද්‍රීය මිත්‍රශීලී රාජ්‍ය සේවයක් උදෙසා නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, රටේ තිරසාර සංවර්ධනය ළඟා කරගනිමින් මහජන සහභාගීත්වයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ඇති කිරීම තුළින් කාර්යක්ෂම රාජ්‍ය අංශයක් රට තුළ ස්ථාපනය කිරීම සඳහා රජය මහත් පරිශ්‍රමයක් දරනු ලබයි. තවද, ජාතික ආරක්ෂාවට ප්‍රමුඛතාවය දෙමින් මිත්‍රශීලී හා නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමටත්, දූෂණයෙන් තොර විනයගරුක රාජ්‍ය සේවයක් හා නීතිය තහවුරු වූ සාරධර්ම පදනම් කරගත් යහපත් සමාජයක් බිහිකිරීමත් යහපාලනය මඟින් වැඩිදුරටත් අපේක්ෂා කෙරේ. ඒ සඳහා රටේ රාජ්‍ය ආයතන වල අඛණ්ඩ වැඩිදියුණුකිරීම්, මානව සම්පත් වර්ධනය හා සේවා සැපයීම් වල

ඵලදායීතාවය ඉහළ නැංවීම යනාදිය රාජ්‍ය අංශයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වේ.

රාජ්‍ය පරිපාලනය, මහජන ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, ජනමාධ්‍ය, අධිකරණ, විදේශ සබඳතා, සංස්කෘතිය සහ ජාතික උරුමයන්ට අදාළ විෂයයන් යහපාලනයේ ප්‍රධාන අංශ වන අතර මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තුව සහ ස්වාධීන කොමිෂන් සභා යනාදී විශේෂ වියදම් ඒකක වලට අදාළ ව්‍යාපෘති යේජනා ඇගයීමේ කාර්යයන්ද යහපාලන අංශයේ විෂය පථය යටතේ සලකා බැලේ.

2020 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය කළමනාකරණ හා යහපාලන අංශයේ අභිවෘද්ධිය උදෙසා විවිධාකාරයෙන් ලබා දෙන ලද දායකත්වය පහත පරිදි වේ;

- 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී ඇති ව්‍යාපෘති යෝජනා 139 ක් ඇගයීමට ලක්කර ඒවා සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.
- රාජ්‍ය කළමනාකරණ හා යහපාලන අංශයට අදාළව විවිධ අමාත්‍යාංශවලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 12 ක් සඳහා ගරු මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සකස් කිරීමට අවශ්‍ය සහය ලබා දෙන ලදි.
- විටින් විට රාජ්‍ය කළමනාකරණ හා යහපාලන අංශයට අදාළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී විමත්, ඒ අංශය සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මගපෙන්වීම් ලබා දීමත් සිදු කරන ලදී.
- ආංශීය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීමේදී අදාළ රේඛීය අමාත්‍යාංශවලට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමද සිදු කරන ලදී.
- රාජ්‍ය ආයෝජන සැලසුම් සකස් කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කර පවත්වන ලදී.

## 03 පරිච්ඡේදය- 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ එෆ්

**2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | 2019 |
|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - |
| - | ආදායම් බදු | 1 | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - |

| | | | | |
|---|---|---|---|---|
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 108,053,408 | 105,489,000 |
| - | තැන්පතු | | 85,906 | 29,115 |
| - | අත්තිකාරම් ගිණුම් | | 7,232,008 | 8,093,164 |
| - | වෙනත් ලැබීම් | | 5,112,407 | 4,725,440 |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **120,483,728** | **118,336,719** |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **120,483,728** | **118,336,719** |
| | **අඩුකළා : වියදම්** | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - |
| 85,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 83,748,297 | 72,655,651 |
| 23,327,642 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 20,017,346 | 25,218,218 |
| 1,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 950,429 | 859,075 |
| - | පොළී ගෙවීම් | **8** | - | - |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - |
| **109,327,642** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **104,716,071** | **98,732,944** |
| | **මූලධන වියදම්** | | | |
| 1,275,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 1,216,613 | 2,672,121 |
| 4,547,358 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 3,887,968 | 2,937,101 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | | - |
| 1,500,000 | හැකියා වර්ධනය | **14** | 794,770 | 4,411,292 |
| 32,600,000 | වෙනත් මූලධන වියදම් | **15** | 32,158,606 | 40,862,055 |
| **39,922,358** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **38,057,957** | **50,882,568** |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **7,017,423** | **5,619,305** |
| | **තැන්පතු ගෙවීම්** | | 78,456 | 29,115 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 6,938,967 | 5,590,190 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **149,791,451** | **155,234,817** |
| **149,250,000** | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(29,307,722)** | **(36,898,098)** |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

# 2020.12.31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2020** | **2019** |
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 87,441,485 | 102,640,033 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 14,042,155 | 14,335,196 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 912 | 15,227 |
| **මුළු වත්කම්** | | **101,484,552** | **116,990,456** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 14,034,705 | 14,335,196 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 87,441,485 | 102,640,033 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 7,450 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 912 | 15,227 |
| **මුළු වගකීම්** | | **101,484,552** | **116,990,456** |

පිවු අංක 05.සිට 54 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන පිවු අංක 55 සිට 62 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා. ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : එස්.ආර්.ආටිගල | නම : ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි | නම : ඩබ්.එස්.පී.ද මෙල් |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2021.02. 20 | දිනය : 2021.02. 18 | දිනය : 2021.02.18 |

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරී
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

### 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | 2020<br>රු. | 2019<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | 5,112,407 | 197,577 |
| අග්‍රිම ලැබීම් | 108,053,408 | 105,489,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **113,165,815** | **105,686,577** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 103,609,022 | 88,842,180 |
| සහනාධාර සහ මාරුකිරීම් | 950,429 | 859,075 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,174,153 | 195,667 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 912 | 15,227 |

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **105,734,516** | **89,912,149** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **7,431,299** | **15,774,428** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අය කර ගැනීම | 7,337,681 | 282,439 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **7,337,681** | **282,439** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 8,074,314 | 11,880,197 |
| අත්තිකාරම් ගෙවීම් | 6,702,117 | 4,151,370 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **14,776,430** | **16,031,567** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(7,438,749)** | **(15,749,128)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(7,450)** | **25,300** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 85,906 | 3,815 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **85,906** | **3,815** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 78,456 | 29,115 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **78,456** | **29,115** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **7,450** | **(25,300)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන (11)** | 109,450,000 | 109,327,642 | 104,716,071 | 95.78 |
| උප එකතුව | **109,450,000** | **109,327,642** | **104,716,071** | **95.78** |
| **ප්‍රාග්ධන** | | | | |
| දේශීය අරමුදල් (11) | 7,200,000 | 7,322,357.76 | 5,899,351.37 | 80.57 |
| **ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් සපයන වැඩසටහන** | | | | |
| විදේශ ණය (12) | 25,100,000 | 30,100,000 | 29,983,643 | 99.61 |
| විදේශ මූල්‍යනය ආශ්‍රිත දේශීය පිරිවැය (17) | 2,500,000 | 2,500,000 | 2,174,962 | 87.00 |
| උප එකතුව | **34,800,000** | **39,922,358** | **38,057,957** | **95.33** |
| මුළු එකතුව | **144,250,000** | **149,250,000** | **142,774,028** | **95.66** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙ පාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 87,441,485 | 87,441,485 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුනුම I ලෙස දක්වා ඇත

## 04පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | 100% | | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 93 % | | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 100% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | 100% | | |
| නිර්දේශ කරන ලද යෝජනා ගණන | 100% | | |

## 05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල සංවර්ධන සැලසුම්, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා තිරසාර සංවර්ධන අරමුණු අග්‍රගතකර එහි අදාල ඉලක්ක ලගාකරගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලදි.

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**
අදාල නැත

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 46 | 13 |
| තෘතීයික | 02 | 00 | 02 |
| ද්විතියික | 28 | 17 | 11 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාථමික | 29 | 20 | 09 |

**06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමෙන් රාජකාරි ඉටු කිරීමේදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුනි

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පෞද්ගලික ලිපිගොනු ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම | 01 | 01 දිනක් | 4000.00 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම |
| රජයේ නිලධාරීන්ගේ නිවාඩු විධිවිධාන | 01 | 02 දිනක් | 8500.00 | | දේශීය | -එම - |
| රාජයේ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය ඩිප්ලෝමා පාඨමාලාව (මිලෝදා) | 01 | 01 අවුරුද්දක් | 100000.00 | | දේශීය | -එම - |
| ශාස්ත්‍රපති උපාධි වැඩසටහන | 02 | 01 අවුරුද්දක් | 268500.00 | | දේශීය | -එම - |
| රජයේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා අන්තර්ජාල සාක්ෂරතාව හා සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ වැඩමුළුව | 01 | 01 දිනක් | 20000.00 | | දේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උසස් ඉංග්‍රිසි ඩිප්ලෝමා පාඨමාලාව | 01 | 02 අවුරුදු | 20000.00 | | දේශීය | -එම - |

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල වේ** | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | **අනුකූල වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |

**අවසානය.**